වාර්ෂික වාර්තාව - 2019

ජාතික පර්යේෂණ සභාව

ජාතික පර්යේෂණ සභාව
120/7, විද්‍යා මාවත, කොළඹ 07
දුරකථන අංකය: 011-2675176 ෆැක්ස්: 011-2675136
ඊ-මේල්: admin@nrc.gov.lk වෙබ්: www.nrc.gov.lk

පටුන

පටුන 1

දැක්ම හා මෙහෙවර 2

අරමුණු 3

කාර්යයන් 4

කවුන්සිලය (2019-01-01 සිට 2019-11-28 දක්වා) 5

කාර්ය මණ්ඩලය 6

සභාපතිතුමාගේ පණිවුඩය 7

ප්‍රධාන විධායක නිලධාරි වාර්තාව 8

පසුගිය වසර 3 සඳහා අදාළ මූල්‍ය සුවිශේෂිතාවන් 11

ජාතික පර්යේෂණ සභාවේ වැඩසටහන් 13

2019 විශේෂ අවස්ථා 16

ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන 16

අන්වේශක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන 19

විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන 23

පෞද්ගලික රාජ්‍ය සහයෝගිතා වැඩසටහන 25

වෙනත් වැඩසටහන් 27

විගණකාධිපති වාර්තාව 30

සම්බන්ධවිය හැකි අයුරු පිළිබඳ තොරතුරු 31

දැක්ම

“දැනුම හා විද්‍යාව පදනම් කරගත්
සංවර්ධිත රටක තත්ත්වයට
ශ්‍රී ලංකාව පත් කිරීම”

මෙහෙවර

“මූලික හා ප්‍රායෝගික පර්යේෂණ ප්‍රවර්ධනය,
මූල්‍යනය හා පහසුකම් සැපයීම සහ අධීක්ෂණය සහ
ශ්‍රී ලංකාවේ මානව සම්පත් වර්ධනය තුළින්
දැනුම හා විද්‍යාව පදනම් කරගත්
සංවර්ධිත රටක තත්ත්වයට ශ්‍රී ලංකාව පත්කිරීම”

අරමුණු

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 2016 අංක 11 දරණ පනත හා අනුකූලව, ජාතික පර්යේෂණ සභාවේ අරමුණු වන්නේ;

- රට තුළ ක්‍රියාකාරී විද්‍යාත්මක සහ තාක්ෂණික ප්‍රජාවක් ගොඩනැංවීම අරමුණු කරගනිමින් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම පිණිස පහසුකම් සපයාදීම සඳහා රජයට සහායවීම;
- ජාතික අවශ්‍යතාවන් සඳහා දායකත්වය සපයන පර්යේෂණ පදනමක් සංවර්ධනය කිරීම පිණිස උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය අංශයේ පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හි සහ වෙනත් රාජ්‍ය ආයතනයන්හි විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළව සිදුකෙරෙන පර්යේෂණ ප්‍රවර්ධනය සහ ඒ සඳහා පහසුකම් සැලසීම; හා
- විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝගීතාවය අපේක්ෂා කිරීම;

කාර්යයන්

- සභාවේ අරමුණු ළඟා කරගනු වස් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණයන් සිදුකිරීම සඳහා ප්‍රතිපාදන සලසාදීම;
- පර්යේෂණ සඳහා රජය විසින් සිදුකරනු ලබන ආයෝජනයන් ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කරනු පිණිස, උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතන සහ වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදී ඇති ප්‍රතිපාදන හා සම්බන්ධ විද්‍යා හා තාක්ෂණික පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය හා සුපරීක්ෂණය සිදුකිරීම;
- සභාවෙහි කාර්යයන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයනය කිරීම සහ පිළිගත් දේශීය හෝ විදේශීය ප්‍රභවයන් වෙතින් උපකරණ, අරමුදල් සහ අනෙකුත් සහායයන් ලබාගැනීම;
- විද්‍යාව හා තාක්ෂණය සහ අදාළ විෂයයන් පිළිබඳව සිදුකෙරෙන පර්යේෂණයන්හී වාර්තා, වාර සඟරා සහ පත්‍රිකා ඒකරාශී කිරීම, මුද්‍රණය සහ ප්‍රකාශයට පත්කිරීම;
- දේශීය හෝ විදේශීය විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හී සිදුකෙරෙන විද්‍යාත්මක අධ්‍යයනයන් හෝ විද්‍යාත්මක කාර්යයන් සඳහා ශිෂ්‍යත්ව සහ අධිශිෂ්‍යත්ව පිරිනැමීම;
- විද්‍යාව හා තාක්ෂණයට අදාළව සිදුකෙරෙන පර්යේෂණ හා නවෝත්පාදන පිළිගැනීමට ලක්කිරීමේ සහ ඒවාට සම්මාන ප්‍රදානය කිරීමේ ජාතික වැඩපිළිවෙලක් වැඩිදියුණුකිරීම; සහ
- විද්‍යාව හා තාක්ෂණය සහ අදාළ විෂයයන් ආශ්‍රිතව සිදුකෙරෙන පර්යේෂණ පිළිබඳ දේශන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම.

කවුන්සිලය (2019-01-01 සිට 2019-11-28)

සභාපති

1. මහාචාර්ය හිතනාදුර ජනක ද සිල්වා (2019-11-08 දින ඉල්ලා අස් විය)

අනෙකුත් සාමාජිකයින්

2. මහාචාර්ය කෙමල් ඩීන්
3. මහාචාර්ය වේරංජ කරුණාරත්න
4. මහාචාර්ය නයනි මිලේගොඩ
5. මහාචාර්ය කාමිනී නිර්මලා මෙන්ඩිස්
6. ෆසිල් මුෂින් මයා
7. මහාචාර්ය මලික් රණසිංහ
8. මහාචාර්ය පී.රවිරාජන්

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ නියෝජිත

9. හිමාලි අතාවුදගේ මිය

භාණ්ඩාගාර නියෝජිත

10. ඊ.ඒ. රත්නසීල මයා

කාර්ය මණ්ඩලය

ප්‍රධාන විධායක නිලධාරි:	එම්.සී. රාජපක්ෂ
සහකාර අධ්‍යක්ෂ (විද්‍යාත්මක කටයුතු):	පි. කේ. ඒ. එස්. ආර්. නෝනිස්
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය):	ආර්. ඩී. එස්. දිසානායක
විද්‍යාත්මක/ පර්යේෂණ නිලධාරී:	කේ.එන්.කේ. දිසානායක
විද්‍යාත්මක/ පර්යේෂණ නිලධාරී:	ඩබ්.කේ.එන්. හංසනා
විද්‍යාත්මක/ පර්යේෂණ නිලධාරී:	එස්.එස්. කටුගම්පල
විද්‍යාත්මක/ පර්යේෂණ නිලධාරී:	එම්.එස්. පෙරේරා
විද්‍යාත්මක/ පර්යේෂණ නිලධාරී:	බී.එම්.එන්.සී. කරුණාරත්න
පරිපාලන නිලධාරි:	ඒ.කේ.ඩී.එම්. පෙරේරා
ගිණුම් නිලධාරි:	ඒ.ඊ.කේ. දයාරත්න
ප්‍රසම්පාදන නිලධාරි:	ඩබ්.ඩී.ටී.ඩී. වික්‍රම
කළමනාකරණ සහකාර:	එස්.එච්.එස්. ප්‍රියංකර
කළමනාකරණ සහකාර:	එම්.ඩී.ටී. මධුෂානි
කළමනාකරණ සහකාර:	එම්.එස්. සෙව්වන්දි
කළමනාකරණ සහකාර:	එම්.ඒ.කේ.එල්. පෙරේරා
කළමනාකරණ සහකාර:	කේ.ඒ.ඩී.එම්. කරුණාසිංහ
කළමනාකරණ සහකාර:	එන්.ඊ. අත්තනායක
රියදුරු:	කේ. කේ. ටී. සඳරුවන්
රියදුරු:	එස්.එස්.ජයසිංහ

2019.12.31 දිනට

සභාපතිතුමාගේ පණිවුඩය

ජාතික පර්යේෂණ සභාවේ (NRC) 2019 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව, පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත්කරනුයේ ඉමහත් සතුටිනි. ජාතික පර්යේෂණ සභාවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ පර්යේෂණ සඳහා අරමුදල් ලබාදීම හා ශ්‍රී ලංකීය විද්‍යාඥයින්යින් විසින් සිදුකරනු ලබන සාර්ථක පර්යේෂණ හා නවෝත්පාදන සඳහා ජාතික වශයෙන් පිළිගත් වැඩපිළිවෙලක් සකස් කිරීම හා සම්මාන පිරිනැමීමයි.

2019 වසරේදී ජාතික පර්යේෂණ සභාව සිය 29 වන සංවත්සරය සමරනු ලැබීය. ජාතික පර්යේෂණ සභාව විසින් පහසුකම් සලසනු ලැබූ වැඩසටහන් හා ආර්ථිකයට, සමාජයට හා පරිසරයට එහි දායකත්වය විදහා දක්වන සැමරුම් මුද්දරයක් නිකුත්කරමින් මෙම සංවත්සරය සමරනු ලැබීය. 2019 වසර තුලදී ජාතික පර්යේෂණ සභාව විසින් පහත දැක්වෙන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය; අන්වේෂක මත පදනම් පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා (PPP) වැඩසටහන, ඉලක්ක මත පදනම් බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන වැඩසටහන, සුහසාධක හා මහජනයා දැනුම්වත් කිරීමේ වැඩසටහන. 2019 වසරේදී ජාතික පර්යේෂණ සභාව සඳහා රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා වැඩසයහන මගින් ප්‍රථම වරට හිමිකාරිත්වය ලැබීම ආරම්භවූ අතර එමගින් ජාතික පර්යේෂණ සභාවට මුදල් උපයන ආයතනයක් ලෙස නැගී සිටීමට හැකි විය. නවෝත්පාදන සඳහා ඉවහල්වන අංග දෙක වන යම් අදහසක් මූලාකෘති සංකල්පය දක්වා හා මූලාකෘතියේ සිට වාණිජකරණය කරන ලද නිෂ්පාදන/ක්‍රියාවලිය දක්වා පරිවර්තනය කිරීමට හැකිවනසේ PPP වැඩසටහන් සංශෝදනය කරනු ලැබිය. ඉලක්ක මත පදනම් බහුවිෂයානුබද්ධ පර්යේෂණ වැඩසටහන ජාතික පර්යේෂණ සභාවේ ප්‍රධාන වැඩසටහන බවට පත්වෙමින්, 2014 වසරේදී ආරම්භකර ඇති ව්‍යාපෘති වලින් එක් ව්‍යාපෘතියක් සම්පූර්ණ කර ඇත. වසරේ මහජනයා දැනුම්වත් කිරීමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන පොලිතීන් තිරසර කළමනාකරණය පිළිබඳ සුහසාධක වැඩසටහන, මේ දක්වා සිදුකළ කාර්යයන් වෙනුවෙන් විශේෂයින් විසින් නිර්දේශ කර ඇති අතර එය නිර්දේශ සඳහා අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීමෙන් විශේෂයෙන් කැපි පෙනින.

2013 වසරේ සිට ජාතික පර්යේෂණ සභාවේ සභාපතිවරයා ලෙස කටයුතු කරනු ලැබූ මහාචාර්ය ජනක ද සිල්වා මහතා 2019 නොවැම්බර් මාසයේදී ඉල්ලා අස්විය. ඔහුගේ පාලන කාලය තුල කාර්ය මණ්ඩලය ස්ථීර කිරීමත් සමග පාර්ලිමේන්තු පනතක් මගින් ජාතික පර්යේෂණ සභාව ස්ථාපිත කිරීම සඳහා මූලික කටයුතු සිදු කරනු ලැබීය. හිටපු සභාපතිවරයා හා කවුන්සිලය ඇගයීමට ලක් කරන අතරම 2019 වසර තුලදි අප වෙත වෙත ලබාදෙනු ලැබූ සහය හා දිරිමත් කිරීම වෙනුවෙන් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යවරයාට මෙන්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාට මාගේ කෘතඥතාවය පළකරනු කැමැත්තෙමි.

මහාචාර්ය හේමන්ත දොඩම්පහල
සභාපති

ප්‍රධාන විධායක නිලධාරි වාර්තාව

ජාතික පර්යේෂණ සභාව සිය 20වන සංවත්සරය සමරන මෙම විශේෂ අවස්ථාවේ දී ජාතික පර්යේෂණ සභාවේ 2019 වාර්ෂික වාර්තාව සඳහා පණිවුඩයක් ලබාදීමට හැකිවීම පිළිබඳව සතුටු වෙමි. ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලද NRC ක්‍රමයෙන් එහි වත්මන් තත්වය දක්වා ස්ථාවර ලෙස වර්ධනය විය. අද වන විට ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ සඳහා මූල්‍යාධාර ලබාදෙන ප්‍රමුඛ ආයතනය වන එමගින් පර්යේෂණ වැඩසටහන් ගණනාවන් සඳහා පහසුකම් සලසන අතර විද්‍යාඥයින්ගේ උසස් පර්යේෂණ සඳහා පිළිගැනීමක් ලබාදීම හා ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය සඳහා පර්යේෂණ මගින් ඇතිවන බලපෑම ඇගයීම සිදුකරනු ලැබේ.

2020 මැයි 2වන දින NRC සිය 20වන සංවත්සරය සමරනු ලැබූ අතර මෙම අවස්ථාව වෙනුවෙන් සමරු මුද්දරයක් නිකුත් කරනු ලැබීය. මෙම මුද්දරය මගින් NRC මගින් පහසුකම් සලසනු ලැබූ වැඩසටහන් හා ආර්ථිකය, සමාජය හා පරිසරය කෙරෙහි එමගින් ලද දායකත්වය පෙන්නුම් කරනු ලැබීය.

2016 අංක 11 දරණ පනත හා අනුකූලව ජාතික පර්යේෂණ සභාවේ ප්‍රධාන අරමුණු වන්නේ, රට තුළ ක්‍රියාකාරී විද්‍යාත්මක සහ තාක්ෂණික ප්‍රජාවක් ගොඩනැංවීම සඳහා විද්‍යා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම පිණිස පහසුකම් සපයාදීම සඳහා රජයට සහාය ලබාදීම, ජාතික අවශ්‍යතාවන් සඳහා දායකත්වය සපයන පර්යේෂණ පදනමක් වැඩිදියුණු කිරීම පිණිස උසස් අධ්‍යාපන ආයතනයන්හී, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතනයන්හී සහ වෙනත් රාජ්‍ය ආයතනයන්හී විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළව සිදුකෙරෙන පර්යේෂණ ප්‍රවර්ධනය, ඒ සඳහා පහසුකම් සැලසීම සහ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණයන් වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝගිතාවය අපේක්ෂා කිරීමයි.

ජාතික පර්යේෂණ සභාවේ ප්‍රමුඛ කාර්යය වනුයේ පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හි හා උසස් අධ්‍යාපන ආයතනයන්හි පර්යේෂකයින්ට පර්යේෂණ සිදුකිරීම සඳහා ප්‍රදානයන් ලබාදීම හා විද්‍යාව හා තාක්ෂණයට අදාල පර්යේෂණ හා නවෝත්පාදන පිළිගැනීමට ලක්කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස්කිරීම හා ඒ සඳහා සම්මාන පිරිනැමීමවේ.

මෙම වැදගත් අභිමතාර්ථ ලගාකරගැනීම සඳහා 2017 වර්ෂය තුළදී ජාතික පර්යේෂණ සභාව විසින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබිණි; අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතා වැඩසටහන, ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන, සමාජ සුභසාධක සහ මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන.

1999 දී ආරම්භවූ අන්වේෂක මත පදනම් පර්යේෂණ ප්‍රදාන වැඩසටහන පසුගිය 20 වසර පුරාම ක්‍රියාත්මක විය. එය විද්‍යාඥයින්ට නවෝත්පාදන පර්යේෂණ සිදුකිරීමට හා නව දැනුම නිර්මාණය කිරීම සඳහා පහසුකම් සලසන කරගකාරී ප්‍රදාන යෝජනාක්‍රමයකි. වාර්ෂිකව සිදුකරන විවෘත අයදුම්පත් කැඳවීමේදී අයදුම්කරුවන්ට කුමන හෝ විද්‍යාත්මක ක්ෂේත්‍රයකින් අයදුම්කළ හැකිවේ. 2019 වසර තුලදී අයදුම්පත් 102ක් ලැබූ අතර පශ්චාද් උපාධි අධිශීෂ්‍යත්ව 20ක් පිරිනමමින් ඉන් 28ක් සඳහා මූල්‍යාධාර ලබාදෙනු ලැබීය. 2018දී නිර්දේශ ගණනාවක් ලබාදෙනු ලැබූ අතර ප්‍රදාන යෝජනාක්‍රමයන්හි අධීක්ෂණය කිරීමේ හා ඇගයීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා මෙම වසරේදී ආර්. මහින්දපාල වාර්තාව ක්‍රියාත්මක කරනු ලැබීය. එමනිසා 2019 වසරේ සිට ප්‍රදානය සඳහා පත්කරනු ලැබූ උපදේශකවරයාගේ එකඟතාවය ඇතිව ප්‍රධාන අන්වේෂක විසින් මාස 6කදී ආරම්භක වාර්තාව ඉදිරිපත් කරනු ලබන අතර සෑම වසරකම නොවැම්බර් මාසයේදී වාර්ෂික වාර්තාව කැඳවීමේ පෙර පැවති වැඩපිලිවෙලින් බැහැරව මාස 12කදී වාර්ෂික ඇගයීම සිදුකරනු ඇත. වසර තුලදී ප්‍රදානයන් 150කට වැඩිගණනක් ක්‍රියාත්මක විය. ජාත්‍යන්තර ප්‍රකාශන 59 ක් සමග ප්‍රදානයන් 41ක් සම්පූර්ණ කරනු ලැබූ අතර පශ්චාද් උපාධි අපේක්ෂකයින් 06දෙනෙකු තම දර්ශනපති උපාධි ලබාගැනීම මෙන්ම ජාත්‍යන්තර සමුළු 83කදී පර්යේෂණ මගින් සොයාගැනීම් තොරතුරු බෙදාහැරීම සිදුවිය.

මෙම වසරේ සිට බලපෑම් ඇගයීම NRC ඇගයීම් ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය කොටසක් වනු ඇත. ආර්. මහින්දපාල වාර්තාව (2018) මගින් 2005 හා 2011 කාලය අතරතුර පිරිනැමූ සම්පූර්ණ කරන ලද ප්‍රදානයන් 50ක් ඇගයීම් කර පර්යේෂණයන්හි ප්‍රතිඵල මගින් වැඩි බලපෑමක් ඇතිවිය හැකි ප්‍රදානයන් 08ක් තෝරාගනු ලැබීය. මෙම ප්‍රදානයන් අට අතරින් එකී පර්යේෂණ ප්‍රදානයන් මගින් ජාතික සංවර්ධනයට ඇතිවන බලපෑම ප්‍රමාණ කිරීම සඳහා ප්‍රදානයන් හතරක් තෝරාගනු ලැබීය. ඇගයීම මගින් 2016දී ජාතික ප්‍රතිපත්ති දක්වා මග සලසනු ලැබූ ආයෝජන කෙරෙහි ඉහල බලපෑමක් ඇතිකරන ලද වෛද්‍ය පර්යේෂණයක් විශේෂයෙන් දක්වනු ලැබීය.

2012දී ආරම්භ කරන ලද රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා (PPP) වැඩසටහන මගින් රජයේ පර්යේෂණ හා සංවර්ධන ආයතන හා විශ්ව විද්‍යාලවල විද්‍යාඥයින් හා පෞද්ගලික අංශය අතර හවුල්කාරිත්වයන් සඳහා පහසුකම් සැලසේ. මෙම ව්‍යාපෘති මගින් විසඳුම් ලබාදිය යුතු පර්යේෂණ ක්ෂේත්‍ර හා ඒවායේ වාණිජමය ශක්‍යතාවය පැහැදිලිවම හඳුනාගැනේ. වසර තුල ව්‍යාපෘති දෙකක් නිමකරනු ලැබීය. එමෙන්ම වසරේදී ලද අභිමතයන් පලකිරීම් හතක් සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබීය. නැනෝ ද්‍රව්‍ය පිළිබඳ එක් ව්‍යාපෘතියක් මූල්‍යාධාර ලබාදීම සඳහා තෝරාගනු ලැබූ අතර පෝෂක නිෂ්පාදන පිළිබඳ තවත් ව්‍යාපෘතියක් සමාලෝචනය කරමින් පවතී. මෙම වසර තුල ක්‍රියාත්මක සම්පූර්ණ PPP වැඩසටහන් සංඛ්‍යාව 10කි. ප්‍රථම වරට PPP ප්‍රදානයක් මගින් NRC සඳහා හිමිකම් ලැබීම ආරම්භ වූ බැවින් PPP වැඩසටහන් සඳහාද විශේෂ වසරක් වූ අතර ජාතික පර්යේෂණ සභාවට ආදායම් උපයන ආයතනයක් ලෙස නැගී සිටීමට හැකිවිය.

වසර තුලදී PPP වැඩසටහන් නැවත සකස්කර වෙනස්කම් ගණනාවක් හඳුන්වා දෙනු ලැබීය. ඉදිරියේදී ප්‍රදානයන් සඳහා පියවර දෙකකදී මූල්‍යාධාර ලබාදේ. පියවර I මගින් සංකල්පය මූලාකෘතිය දක්වා වන ඕනෑම ව්‍යාපෘතියක් හා පියවර II මගින් මූලාකෘතිය වාණිජකරණය සඳහා ප්‍රදානයන් ලබාදෙනු ඇත. වසර අවසානයේදී මෙම කාණ්ඩ දෙක මගින්ම 2020 වසර සඳහා අයදුම්පත් කැඳවනු ලැබීය.

පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම තුලින් ජාතික වශයෙන් වැදගත් ගැටළු සඳහා දිගුකාලීන විසඳුම් සොයාගැනීම සඳහා 2013 වසරේදී ඉලක්කමත පදනම් බහු-විෂයානුබද්ධ (TO) පර්යේෂණ වැඩසටහන ආරම්භකරනු ලැබීය. මෙම වසරේදී ප්‍රදානයන් පිරිනැමීම සිදුනොවූ නමුත් 2020දී ආධාර ලබාදිය යුතු ප්‍රමුඛ ක්ෂේත්‍ර 10ක් කවුන්සිලය විසින් තීරණය කරනු ලැබීය. දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති නවයක් ඇගයීම හා අධීක්ෂණය සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීණ. මෙම ව්‍යාපෘතිවල සාර්ථකත්වය මගින් TO ප්‍රදාන වැඩසටහනෙහි ඵලදායිතාවය දැක්වෙනු ඇත. සිදුකෙරෙමින් පවතින ප්‍රදානයන් මගින් වසර තුල ප්‍රථිපල ගණනාවක් ලබාගෙන ඇති අතර ඉන් සමහරක් එහි පාර්ශවකරුවන් සමග දැනටමත් ක්‍රියාත්මකකර ඇත.

සිය පර්යේෂණ මගින් ජාත්‍යන්තර ප්‍රමිතීන් කරා ලගාවීමට සමත්වූ විද්‍යාඥයින් සඳහා හිමිවිය යුතු පිළිගැනීම ලබාදීම සඳහා විද්‍යාත්මක ප්‍රකාශන සඳහා වන ජනාධිපති සම්මාන (PASP) වැඩසටහන දියත්කරනු ලැබීය. 1999 සිට ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන මගින් වැඩිවන ප්‍රකාශන සංඛ්‍යාව සමග පර්යේෂණයේ තත්වය වැඩිදියුණු කිරීම සඳහා විශාල ලෙස දායකවී ඇත. ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වැඩසටහනක් වන PASP නොවැම්බර් මාසයේදී පවත්වන නමුත් නොවැම්බර් මාසයේදී ජනාධිපතිවරණය පැවැත්වෙනු ඇතැයි අපේක්ෂා කල බැවින් මෙම වසරේ ජූලි මාසයේදී පවත්වනු ලැබීය.

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රදානත්වයෙන් 2019 අගෝස්තු 26 දින පැවති 2017 වසර සඳහා වන සම්මාන ප්‍රදාන උළෙලේදී උසස්ම තත්වයේ ප්‍රකාශන 100ක් රචනාකළ විද්‍යාඥයින් 338 දෙනෙකු සඳහා උපහාර දක්වනු ලැබීය.

සුභසාධක වැඩසටහන මගින් NRC සමාජය සමග සම්බන්ධ කෙරේ. 2017දී ආරම්භවූ "පොලිතීන් තිරසර භාවිතය" වැඩසටහන උතුරු මැද පළාතේ පාසල් 800ක අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙය පිරිසිදු පරිසරයක් සඳහා NRCහි කැපවීම පෙන්නුම්කරන විශේෂ මූලාරම්භයක් විය. ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමිය විසින් මෙම පාසල්වල සිදුකරනු ලැබූ සමීක්ෂණයන් මගින් වැඩසටහනෙහි බලපෑම ඇගයීම සිදුකරනු ලැබීය. මෙම සමීක්ෂණය පැවැත්වීමේදී පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින්ද සහභාගිවිය. උතුරු මැද පළාතේ පාසල්වල ක්‍රියාත්මක කළයුතු පොලිතීන් තිරසර භාවිතය පිළිබඳ අවසාන නිර්දේශ 2020 ජූලි මාසයේදී

අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා වෙත භාරදෙනු ලැබිය.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් ජූලි හා සැප්තැම්බර් මාසවලදි කොළඹදී හා පොළොන්නරුවේදී නැගීඑන තාක්ෂණයන් පිළිබඳ "ශිල්ප සේනා" ප්‍රදර්ශනය සංවිධානය කරනු ලැබිය. මෙහිදී NRCට ස්නායු තාක්ෂණය පිළිබඳ විෂය පැවරී තිබූ අතර සාර්ථකව පැවති ප්‍රදර්ශන දෙකේදීම NRC ප්‍රදර්ශන කුටිය නැරඹීම සඳහා විශාල පිරිසක් පැමිණියහ.

NRC පර්යේෂණ ප්‍රදානයන්හි වටිනා සොයාගැනීම් පිළිබඳව මහජනයා දැනුවත් කිරීම සඳහා ප්‍රවත්පත් දැන්වීම් 20කට වැඩි ප්‍රමාණයක් පලකරනු ලැබිය.

වසර ආරම්භයේ නව කවුන්සිලයක් පත්කරනු ලැබූ අතර මහාචාර්ය ජනක ද සිල්වා සභාපති ලෙස නැවත පත්විය. ආරම්භයේ සිට පාලක සභා සාමාජිකයෙකු හා 2013 සිට සභාපතිවරයා ද ලෙස කටයුතු කරනු ලැබූ මහාචාර්ය ද සිල්වා මහතා 2019 නොවැම්බර් මාසයේදී සභාපතිධුරයෙන් ඉල්ලා අස්විය. මෙම අවස්ථාවේදී දිගුකලක් NRC සමග කටයුතු කිරීමේදී ඔහු විසින් ලබාදෙනු ලැබූ ඉමහත් දායකත්වය සඳහා NRC වෙනුවෙන් මහාචාර්ය ජනක ද සිල්වා මහතාට ස්තූතිය පලකර සිටිමි. කාර්ය මණ්ඩලය ස්ථිර කිරීම සමගින් පාර්ලිමේන්තු පනතක් මගින් NRC ස්ථාපනය කිරීම සඳහා ගනු ලැබූ අරම්භයන් සම්බන්ධයෙන් ඔහුට විශේෂ ඇගයීමක් හිමිවේ. සභාපති ලෙස කටයුතු කරන කාලය තුල ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ පර්යේෂණයන්හි තත්වය වැඩිදියුණු කිරීම සඳහා ඔහු විසින් පියවර ගණනාවක් ගනු ලැබිය.

වර්ෂය මුළුල්ලේ අප වෙත ලබාදුන් සහාය වෙනුවෙන් කවුන්සිලයේ සාමාජිකයටත්, මහා භාණ්ඩාගාරයේ සහ විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශ නිලධාරීන්ටත් මාගේ කෘතඥතාවය පිරිනැමීමට කැමැත්තෙමි.

ජාතික පර්යේෂණ සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 21 වන අතර මෙම වසර තුල ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා නව සමාජිකයින් 03දෙනෙකු පත්කරනු ලැබිය. මෙම වසරේදී ද කාර්යමණ්ඩලය හුරුකරවීමේ වාරිකාවක් සඳහා සහභාගි වූ අතර ක්ෂේත්‍රයේ හා පර්යේෂණාගාර තුල සිදුකරන පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳව අවබෝධයක් ලබාගැනීම සඳහා බතලෙගොඩ වී පර්යේෂණ ආයතනය, ශ්‍රී ලංකා නාවික හමුදාව හා නැගෙනහිර විශ්ව විද්‍යාලය යන ආයතනයන්හි සංචාරය කරනු ලැබිය. වඩාත් හොඳ සේවයක් ලබාදීම පිණිස තමාට සරිලන දැනුම ලබාගැනීම සඳහා ඔවුන්ට පුහුණු වැඩසටහන් ගණනාවකට සහභාගිවීමේ අවස්ථාවන් සලසනු ලැබිය. වසර මුළුල්ලේ අඛණ්ඩව සහය ලබාදෙනු ලැබූ කාර්යමණ්ඩලයට මාගේ කෘතඥතාවය පළකරනු කැමැත්තෙමි.

2019 වසර සඳහා ජාතික පර්යේෂණ සභාවට ප්‍රාග්ධන වියදම් ලෙස රු.මිලි. 178ක් සහ ප්‍රනරාවර්තන වියදම් ලෙස රු.මිලි. 24ක් වෙන්කරනු ලැබූ අතර පිළිවෙලින් රු.මිලි. 98ක් සහ රු.මිලි. 24ක් ලැබී තිබුණි. ප්‍රාග්ධන අරමුදලින් 90%කට වැඩි ප්‍රමාණයක් ප්‍රදානයන් පිරිනැමීම සඳහා යොදාගනු ලැබිය. විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් 2018 මූල්‍ය වර්ෂය සඳහා 2019දී නිකුත්කරනු ලැබූ විගණන වාර්තාවේ අංක 1 මතය වන "සත්‍ය හා සාධාරණ මතයක්" ලබාදී තිබේ.

ජාතික පර්යේෂණ සභාව වසර තුල ලගාකරගත් ප්‍රතිඵලයන් 2019 වාර්ෂික වාර්තාව මගින් දැක්වෙන අතර ඉදිරි වසරේද අපගේ පර්යේෂණ ප්‍රජාවට සේවය කිරීමට බලාපොරොත්තු වෙමු....

මනීෂා සී. රාජපක්ෂ
ප්‍රධාන විධායක නිලධාරි

පසුගිය වර්ෂ 3 සඳහා අදාළ මූල්‍ය සුවිශේෂීතාවයන්

වැඩසටහන් (ක්‍රමෝපායන්)		භෞතික ප්‍රගතිය			මූල්‍ය ප්‍රගතිය රු. මිලියන		
	දර්ශකය	2017	2018	2019	2017	2018	2019
ජාතික පර්යේෂණ සභාවේ පොදු පරිපාලනය					20.99	22.80	
පහත වැඩසටහන් සඳහා සංවර්ධන සහය					178.63	161.27	
ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ වැඩසටහන (2014 වසරේදී ආරම්භ කරන ලදී)	වැඩසටහන් සංඛ්‍යාව	එක් වැඩසටහනක් ආරම්භ කරන ලදී.	එක් වැඩසටහනක් ආරම්භ කරන ලදී.	වැඩසටහන් කිසිවක් ආරම්භ නොකෙරිණ			
පෞද්ගලික රාජ්‍ය සහයෝගීතා වැඩසටහන (2013 වසරේදී ආරම්භ කරන ලදී)	වැඩසටහන් සංඛ්‍යාව	වැඩසටහන් 2ක් ආරම්භ කරන ලදී.	වැඩසටහන් 3ක් ආරම්භ කරන ලදී.	එක් වැඩසටහනක් ආරම්භ කරන ලදී.			
අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන වැඩසටහන (1999 වර්ෂයේදී ආරම්භ කරන ලදී)	පිරිනමන ලද පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව	අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන 32ක් පිරිනැමීම	අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන 24ක් පිරිනැමීම. පරිසර හිතකාමී වල් පැලෑටි පාලනය (EWC) සඳහා විශේෂ ප්‍රදානයන් 04ක් පිරිනමනු ලැබිය.	අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන 28ක් පිරිනමනු ලැබිය.	-	-	-

	පිරිනමන ලද ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව	ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව 19ක් පිරිනමනු ලැබීය.	ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව 23ක් පිරිනමනු ලැබීය.	ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව 20ක් පිරිනමනු ලැබීය.			
විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන (PASP) වැඩසටහන (2001 වර්ෂයේදී ආරම්භ කෙරිණි)	පවත්වනු ලැබූ සම්මාන උළෙල හා සම්මානලාභී විද්‍යාඥයින් සංඛ්‍යාව	2015 වර්ෂයේ ප්‍රකාශන සඳහා PASP පවත්වන ලද අතර විද්‍යාඥයින් 295 දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානය කරන ලදී.	2016 වර්ෂයේ ප්‍රකාශන සඳහා PASP පවත්වන ලද අතර විද්‍යාඥයින් 338 දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානය කරන ලදී.	2017 වර්ෂයේ ප්‍රකාශන සඳහා PASP පවත්වන ලද අතර ප්‍රකාශන 338 ක් සඳහා සම්මාන ප්‍රදානය කරන ලදී.	-	-	-
වෙනත් වැඩසටහන්: සමාජ සුභසාධන/ මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන්	සම්පූර්ණ කරනු ලැබූ ක්‍රියාකාරකම්	සමාජ සුභසාධන වැඩසටහන් 6ක් පවත්වන ලදී. ජාතික පර්යේෂණ සභාව විසින් සිදුකරනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 40ක් ප්‍රකාශයට පත්කරන ලදී.	සමාජ සුභසාධන වැඩසටහන් 8ක් පවත්වන ලදී. ජාතික පර්යේෂණ සභාව විසින් සිදුකරනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 18ක් ප්‍රකාශයට පත්කරන ලදී.	සමාජ සුභසාධන වැඩසටහන් 4ක් පවත්වන ලදී. ජාතික පර්යේෂණ සභාව විසින් සිදුකරනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 21ක් ප්‍රකාශයට පත්කරන ලදී.	-	-	-
එකතුව					199.62	184.07	

ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන

සංකීර්ණ ගැටලු පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම හෝ විසඳුම් ලබාදීම සඳහා හුදකලාවූ පර්යේෂණ මගින් හැකියාව ලැබෙනුයේ අල්ප වශයෙනි. බහුවිෂයානුබද්ධ ප්‍රවේශයක් මගින් සාමාන්‍ය සීමාවන්ට පරිබාහිර ගැටලු නැවත අර්ථදැක්වීම සහ දුෂ්කර ගැටලු අලුතින් අවබෝධ කරගැනීම හරහා විසඳුම් වෙත එළැඹීමට හැකිවන පරිදි බහුවිධ විෂයයන් වෙතින් සුදුසු පරිදි දායකත්වයන් ලබා ගැනේ.

මෙම වැඩසටහන 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සමගින් පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් ඉතා කඩිනමින් අවශ්‍ය වන, අතිශය වැදගත් අංශ දහයක් යෝජනාවී ඇත.

රාජ්‍ය විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතන සහ විශ්වවිද්‍යාලයන්හී පර්යේෂක කණ්ඩායම් වෙතින් පූර්ව යෝජනා කැඳවන ලදී. රටේ ආර්ථික සංවර්ධනය, සමාජ සුභසාධනය සහ පාරිසරික තිරසරභාවය අරමුණු කරගනිමින්, ජාතික වශයෙන් අදාළත්වයක් සහිත ගැටලු විසඳාලීම මෙම ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ව්‍යාපෘති හරහා සිදුකිරීමට අපේක්ෂිතය.

ප්‍රතිපත්ති/ ක්‍රමෝපාය හෝ නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය දැනුමෙහි පවතින මූලික හිඳස පියවීම, ජාතියට බාධක හෝ අභියෝග එල්ල කෙරෙන ගැටලු විසඳාලීම මෙම ව්‍යාපතීවල අරමුණු වේ. පර්යේෂණ ප්‍රතිඵල ප්‍රතිපත්ති, ක්‍රමෝපායයන්, නිෂ්පාදන/ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම කෙරෙහි යොදාගැනීමේ මාර්ගය සහ ඒවා භාවිතයට ගැනීම පැහැදිළිව හඳුනාගත යුතුය.

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ජාතික පර්යේෂණ හා සංවර්ධන ප්‍රතිපත්ති රාමුව (වැදගත් ක්ෂේත්‍ර දහයක්) සමඟ අනුගත වෙමින් ප්‍රමුඛ ක්ෂේත්‍රයන් කිහිපයක් වෙතින් යෝජනා කැඳවනු ලැබිණි. එක් ප්‍රදානයක වටිනාකම මිලියන 50ක් වන අතර වසර 5ක කාලසීමාවක් සඳහා මෙම ප්‍රදානයන් සිදුකරයි. ජාතික පර්යේෂණ සභාව විසින් සැලකිය යුතු මහජන මුදල් ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතීන් සඳහා ආයෝජනය කරන හෙයින්, මේ සඳහා මූල්‍යනය ඉතා ඉහළ තරඟකාරී පදනමකින් සිදුකෙරෙනු ඇත. වසර 5ක කාලයකට පසු ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵලයක් ලබාදීමේ හැකියාවක් ඇති බවට ජාතික පර්යේෂණ සභාව විසින් සලකනු ලබන, ව්‍යාපෘතීන්හී කණ්ඩායමක් වශයෙන් එක්ව ක්‍රියා කළ හැකි කුසලතා සහිත, ඉතා සුදුසු පර්යේෂකයින් පමණක් තෝරාගැනීමට ජාතික පර්යේෂණ සභාව විසින් කටයුතු කෙරෙනු ඇත. පර්යේෂණයන්හී විවිධ අංශයන් පිළිබඳව කණ්ඩායමේ සාමාජිකයින් විසින් සමගාමීව කටයුතු කිරීමේ වාසිය මෙම බහුවිෂයයන් මත කේන්ද්‍රගත වූ ව්‍යාපෘති හරහා උදාවනු ඇත.

ප්‍රදානයෙහි මෙහෙයුම් සැලසුම් අන්වේෂක මත පදනම් වූ ප්‍රදානයන්ට සමානවේ. කෙසේ වුවද, ප්‍රධාන අන්වේෂකට අමතරව නියෝජ්‍ය කායකයෙකුද පත්කෙරෙනු ඇත. මෙම ප්‍රදාන ලබාදීමෙන් අනතුරුව, ප්‍රකාශිත ප්‍රතිඵලයන් ළඟාකරගන්නා බවට සහතික කරනු පිණිස මෙම ව්‍යාපෘතීන් විධිමත් හා දැඩිව නිරීක්ෂණය, සුපරීක්ෂණය සහ ඇගැයීමට ලක්කරනු ඇත.

අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන

ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය ආයතන සහ විශ්වවිද්‍යාල මගින් සිදු කෙරෙන අතර ඒ සඳහා රාජ්‍ය ආයතනික ප්‍රතිපාදන, තරඟකාරී ප්‍රදාන සහ පර්යේෂණ ගිවිසුම් වැනි විවිධ ප්‍රභවයන් වෙතින් අරමුදල් ලබාදේ. විද්‍යාඥයින්ගට අවම පරිපාලන අවහිරතා යටතේ සිය පර්යේෂණ කාර්යයන්හී නියැලීමට ඉඩ ප්‍රස්ථා ලබා දීමේ අරමුණෙන් ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන ආරම්භ කරනු ලැබීය.

ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන මගින් රාජ්‍ය ආයතන වලට තරඟකාරී ප්‍රදානයන් පිරිනමනු ලැබේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම වසර ගනනාවක් පුරා ක්‍රමවත් කර ඇති අතර දැන් එය වැඩි හෝ අඩු වශයෙන් පරිසමාප්තවේ. ප්‍රදානයන් පිළිබඳව වාර්ෂිකව දැන්වීම පලකර විද්‍යාත්මක දැක්ම, ජාතික සංවර්ධනයට ඇති අදාලත්වය මත පදනම්ව ඇගයීම් කරනු ලබන අතර ප්‍රතිඵල ජාත්‍යන්තර සහරාවල පලකරනු ලැබේ.

අයදුම්පත් ඉතා දැඩි ඇගයුම් ක්‍රියාවලියකට ලක්කරනු ලැබේ. තෝරාගත් යෝජනා සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සම්පූර්ණයෙන්ම වගකිවයුතු ප්‍රධාන අන්වේශක වෙත සෘජුවම භාණ්ඩාගාරයෙන් ලබාදෙන අරමුදල් සඳහා වන සුදුසු මුදල් වෙන්කිරීම් කවුන්සිලය මගින් තීරණය කරනු ඇත. උපකරණ, පර්යේෂණ සඳහා භාවිතකරන ද්‍රව්‍ය ආදිය සඳහා අරමුදල් සලකා බැලේ.එක් එක් ව්‍යාපෘතිය සඳහා බැංකු ගිණුමක් විවෘත කරන අතර ජාතික පර්යේෂණ සභාව විසින් සියළු ගනුදෙනු අධීක්ෂණය කෙරේ. මෙමගින් විද්‍යාඥයින්ට අවම අවහිරතා යටතේ අරමුදල් භාවිතාකිරීම සඳහා සැලකිය යුතු නම්‍යශීලිත්වයක් ලබාදේ.

වත්මන් ප්‍රදානයන් විවිධ ස්වභාවයෙන් යුතු බව මෙහිදී සඳහන් කල යුතුවේ. ශුද්ධ විද්‍යාව පිළිබඳව හා ආහාර, ජලය, පරිසරය හා බල ශක්තිය පිළිබඳ පර්යේෂණ සඳහා අරමුදල් සැපයීමට අමතරව NRC මගින් පසුව ජාතික ආවේක්ෂණය, වාරිමාර්ග පද්ධති, වන ජීවී හා පාරිසරික සංචාරක කර්මාන්තය, කඨන පරිවර්ථනය, ඉදිකිරීම් හා වාස්තු විද්‍යාව, දුම්රිය මාර්ග සංඥා, ක්‍රීඩා හා වෙනත් ක්ෂේත්‍ර ගණනාවක් සඳහා අරමුදල් ලබාදෙනු ලැබීය.

සියළු වැඩසටහන් සඳහා සරල නමුත් සංකීර්ණ අයදුම්පත් කට්ටලයක් ඉදිරිපත් කෙරේ. NRC වෙත ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව වසර ගණනාවක් තුල වැඩිවීම ධනාත්මක ලක්ෂණයකි. මෙම වැඩසටහන සඳහා ඇති අභියෝගය වන්නේ දැනටමත් NRC විසින් මෙතෙක් ලභාකරගෙන ඇති ප්‍රගතිය ආරක්ෂා කිරීමවේ.

මෙම ප්‍රදානයන්ගෙන් ඉහලම නිමවුම් ලබාගැනීම සඳහා එහි ප්‍රගතිය අධීක්ෂණය හා සුපරීක්ෂණය සඳහා කවුන්සිලය විසින් නව නීති රීති හා මාර්ගෝපදේශ ගණනාවක් හඳුන්වා දී ඇත.

විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන

ජාත්‍යන්තර තලය කරා ළඟාවූ විද්‍යාඥයින්ට බුහුමන් දැක්වීම, ජාතික විද්‍යාත්මක පර්යේෂණයන් ඉහළ නැංවීම යන අභිමතාර්ථයන් පෙරදැරිව පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන ප්‍රදාන වැඩසටහන 2001 වසරේදී ආරම්භ කරනු ලැබිය. 1991 වසරේ සිට මේ දක්වා විද්‍යාත්මක ප්‍රකාශන එළිදැක්වීම පිළිබඳ ජාතික සංඛ්‍යාලේඛන මඟින් අනාවරණ වන්නේ ගුණාත්මක විද්‍යාත්මක ප්‍රකාශනවල සංඛ්‍යාවේ ඉහළ නැඟීමේ ප්‍රවනතාවයෙහි මූලාරම්භය විය හැකිය.

2019 වසරේ සිට තනි විද්‍යාඥයෙකු සඳහා නොව ප්‍රකාශන (පර්යේෂණය) සඳහා සම්මාන පිරිනමනු ලැබේ. ප්‍රකාශන වලට අමතරව විද්‍යාවට අදාල ජාත්‍යන්තර පේටන්ට් බලපත්‍ර සඳහා සම්මාන ලබාදෙනු ඇත. මූලිකවම ශ්‍රී ලංකාව තුල සංකල්පිත හා සිදුකරනු ලබන පර්යේෂණ දිරිමත් කිරීමටද NRC අපේක්ෂා කරන බැවින් ජාත්‍යන්තර සහයෝගිතාවය ඇතිව පර්යේෂණ හා ප්‍රකාශන සිදුකරන අවස්ථාවල ශ්‍රී ලංකීය විද්‍යාඥයින් විසින් දායකත්වය දක්වනු ලබන මට්ටම පිළිබඳව සලකා බලනු ඇත.

කිසියම් විද්‍යාත්මක පර්යේෂණයක් කෙරෙහි පක්ෂග්‍රාහිවීම වැලැක්වීම සඳහා ප්‍රකාශන පෙලගැස්වීම සඳහා යොදාගනු ලැබූ ලකුණුදීමේ ක්‍රමවේදය ප්‍රමිතිකරණය කර ඇත (සඳහන් කරනු ලබන නිර්ණායක පදනම්ව) ; එය විනිවිදභාවයෙන් යුතුව සිදුකරනු ලැබේ - උදා. මහජනයාට ඒ සඳහා ප්‍රවේශවිමට හැකිවේ. මෙම ක්‍රමවේදය මගින් Scopus විසින් පවත්වාගෙන යනු ලබන හා Elsevier BV ට අයත් සහරා නම් කිරීමේ දත්ත ගබඩාවක් වන SCImago Journal Rank (SJR) අනුගමනය කරනු ලැබේ. 2017 වසරේදී ලයිතුගත සහරාවන්හි පලවිම වෙනුවෙන්, 2019 වසර තුලදී ප්‍රකාශන 100ක් සඳහා සම්මාන පිරිනමනු ලැබීය.

රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා වැඩසටහන

ශ්‍රී ලංකාවේ අපේක්ෂිත ආර්ථික සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේදී අත්‍යාවශ්‍ය සාධකයක් වනගෝලීය වෙළඳපළ තුළ තරඟකාරීත්වයන් ඇති අගය එකතු කළ නිෂ්පාදන හා සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනයන් මග සලසනු ඇත. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ සිදු කෙරෙන පර්යේෂණ, ආර්ථිකයේ ප්‍රගමනයට ඉවහල් වන ප්‍රධාන කර්මාන්තයන්හී අවශ්‍යතාවන් සපුරාලන, ඉල්ලුමට සරිලන පර්යේෂණ විය යුතුය.

රාජ්‍ය-පෞද්ගලික දෙඅංශයේ සහයෝගීතා (PPP) වැඩසටහන මගින්, රටෙහි ආර්ථික සංවර්ධනය කෙරෙහි දායකත්වයක් ලැබෙන පරිදි පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සහ කර්මාන්තයන්හී ප්‍රධාන හවුල්කරුවන් සම්බන්ධ කිරීම සිදුකෙරේ. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනයන් ප්‍රවර්ධනය තුලින් අපනයන ආදායම් ඉහළ නැංවීම, අපනයන භාණ්ඩ විවිධාංගීකරණය සහ ආනයන ආදේශක ප්‍රවර්ධනය හරහා ආර්ථික සංවර්ධනය ළඟාකර ගැනීමේ හැකියාව පවතී. නව්‍ය හෝ වඩා හොඳ තත්ත්වයේ නිෂ්පාදන, ක්‍රියාවලි, සේවාවන්, අගය එකතුකිරීම්, වාණිජමය හැකියාවන් සහිත තාක්ෂණික ගැටළු විසඳීම යනාදිය කෙරෙහි යොමුවූ සියළු නවෝත්පාදක පර්යේෂණයන් මෙම වැඩසටහන සඳහා සලකා බැලෙනු ඇත. විවිධ අංශයන් අතර ඇති කරගනු ලබන සහයෝගීතාවයන් තුලින් කාර්මික පර්යේෂණ සහ සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා විසඳුම් සොයාගනු පිණිස අපගේ පර්යේෂණ විශේෂඥතාවය, වියදම්, සේවාවන් සහ පහසුකම් වඩා ඵලදායී අයුරින් හුවමාරුකර ගැනීමේ හැකියාව ලැබේ. මෙම සහයෝගීතාවයන් හරහා රාජ්‍ය අංශයේ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්හි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කෙරෙනු ඇති අතර ඒ සඳහා ගතවන කාලයද අඩු වනු ඇත. රාජ්‍ය අංශයේ සහභාගිත්වය සහිත ව්‍යාපාරයක් මගින් සිදුකරණ පර්යේෂණ හා සංවර්ධන වියදම්වලට අදාලව බදු සහන ලබාදීම හරහා පෞද්ගලික අංශයේ සහයෝගීතාවය දිරිගැන්වේ. ජාතික අවශ්‍යතාවයන් සඳහා පර්යේෂණ මත පදනම් වූ විසඳුම් ලබාදීම සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් රජය - දේශීය ආයතන - අමාත්‍යාංශ - විශ්වවිද්‍යාල - පර්යේෂණ හා සංවර්ධන ආයතන - ව්‍යාපාරික අංශය - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය යන අංශයන් අතර සම්බන්ධීකරණය සිදු කෙරේ.

වෙනත් වැඩසටහන්

සුභසාධක වැඩසටහන්: පර්යේෂණ ප්‍රදානයන්හී ප්‍රතිඵලයන් මහජනතාවට හුවාදැක්වීමේ අරමුණින් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ සෑම කාර්තුවකම සුභසාධක වැඩසටහනක් පවත්වන ලදී. ඊට අමතරව ජාතික පර්යේෂණ සභාව, අධ්‍යාපනික ප්‍රදර්ශන කුටි සඳහා ස්වේච්ඡාවෙන් සහභාගිවූ ප්‍රදානලාභීන් සමගින් ප්‍රදර්ශන ගණනාවකට සහභාගි විය.

මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන්: විද්‍යාඥයින් විසින් සමාලෝචනය කෙරෙනු ලබන සහරාවන්හී තම පර්යේෂණයන් පළකිරීම සඳහා ප්‍රදානලාභීන් දිරිගන්වනු ලැබේ. ඒ අතරම විද්‍යාඥයින් විසින් සිදු කරනු ලබන පර්යේෂණයන් පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම අරමුණු කරගනිමින් සිය සොයාගැනීම් පුවත්පත්වල පළකිරීම සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් විද්‍යාඥයින්ට පහසුකම් සලසනු ලැබේ.

2019 වසරේ විශේෂ අවස්ථා

ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන

2019 ඔක්තෝබර් මාසයේදී NRC විසින් 2020 වසර සඳහා නව ප්‍රදානයන් සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම් පලකරනු ලැබීය.

	2014	2016	2018	2020
ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව	60	50	25	48
විස්තරාත්මක යෝජනා සඳහා අවසන් කෙටි ලේඛනගත කරනු ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව	21	11	06	08
ඉදිරිපත් කිරීම් සඳහා අවසන් කෙටි ලේඛනගත කරනු ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව	11	06	03	07
පිරිනමන ලද ප්‍රදානයන් සංඛ්‍යාව	05	03	01	ක්‍රියාත්මකව පවතී

2014, 2016 හා 2018 වර්ෂයන්හීදී පිරිනමන ලද ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ ප්‍රදානයන් නවයක් 2019 වසර තුළදී ක්‍රියාත්මකව පැවති අතර, ජාතික පර්යේෂණ සභාවේ ව්‍යාපෘති අධීක්ෂණ උපදේශක, මහාචාර්ය ආර්.බී. මාපා මහතා විසින් ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී.

දැනට ක්‍රියාත්මකව පවතින ඉලක්ක මත පදනම් වූ ප්‍රදාන:

- **වාහකයින් පාලනය මගින් ශ්‍රී ලංකාවේ ඩෙංගු පාලනය සඳහා මෙහෙයුම් ආකෘතියක්, ආරක්ෂක නිෂ්පාදන වැඩිදියුණු කිරීම සහ ප්‍රජාවන් ඒකරාශි කිරීම පිළිබඳ අංගසම්පූර්ණ පර්යේෂණ යෝජනාවක්**





(ප්‍ර:අ: ආචාර්ය එම්. හපුගොඩ සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය නිල්මිණී ගුණවර්ධන, කැළණිය විශ්වවිද්‍යාලය)

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, ස්වාභාවික අභිජනන වාසස්ථාන අවම කිරීම, නැනෝ තාක්ෂණය භාවිතයෙන් නිපදවූ කෘමිනාශක මගින් ප්‍රතිකර්ම කරන ලද ජනේල තිරරෙදි සහ මදුරු දැල් භාවිතයෙන් මදුරුවන් දෂ්ඨ කිරීම අවම කිරීම සහ ඩෙංගු පාලනය සඳහා ප්‍රජා සහභාගීත්වය වැඩිදියුණු කිරීම හරහා රසායන විද්‍යාත්මකව සහ ජෛව විද්‍යාත්මකව ඩෙංගු වාහකයින් පාලනය කිරීමයි.

- **ශ්‍රී ලංකාවේ සර්ප දෂ්ඨ කිරීම් සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීම**





(ප්‍ර:අ: මහාචාර්ය අයි.බී. ගවරම්මාන සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය ඒ. දංගොල්ල, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

නවීන තාක්ෂණික සර්පාගාරයක් වැඩිදියුණු කිරීම හරහා ශ්‍රී ලංකාවේ වෛද්‍ය විද්‍යාත්මක වැදගත්කමකින් යුත් සර්පයින්ගේ විෂ එක්රැස් කිරීම හා විශ්ලේෂණය, ශ්‍රී ලංකාවේදී දෂ්ටනය සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේදී ප්‍රතිවිෂ නිෂ්පාදනය සඳහා අශ්වයින් යොදා ගැනෙන පර්යේෂණ සංකීර්ණයක් ස්ථාපනය කිරීම මෙහි අරමුණ වේ.

කිරි නිෂ්පාදනය අතින් ස්වයංපෝෂී තත්ත්වය ළඟාකර ගැනීම සඳහා කිරි කර්මාන්තය වැඩිදියුණු කිරීම



(ප්‍ර:අ: කේ. මහීපාල මයා සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය තුසිත් සමරකෝන්, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, පෝෂණ කළමනාකරණය වැඩිදියුණු කිරීම, වඩා හොඳ ආහාර භාවිතා කිරීම, පැටවුන් බිහි කිරීමේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, උපරිම ගැබ් ගැනීමේ ශීඝ්‍රතාවයක් සඳහා සම්මුහුර්තකරණ ක්‍රියාවලිය භාවිතය, දින 18-20 දී පූර්ව ගැබ් ගැනීම හඳුනාගැනීමේ අඩු වියදම් ක්ෂේත්‍ර කට්ටලයක් හඳුන්වා දීම, මැස්ටයිටිස් රෝගය සඳහා පොදු රෝග නිධාන හඳුනාගැනීම, රෝග හටගැනීම සහ ව්‍යාප්තිය අවම කිරීම සඳහා සුදුසු ප්‍රතිජීවක ඇසුරෙන් ප්‍රතිකාර කිරීම සහ සත්ත්ව සුභසාධනය වැඩිදියුණු කිරීම මගින් කෘෂිකර්මාන්තය සඳහා සුදුසු සියළු ප්‍රදේශවල කිරි ඵලදාව වැඩිකිරීමවේ.

ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව පවතින රෝග නිධානය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ අංගසම්පූර්ණ අධ්‍යයනයක්



(ප්‍ර:අ: මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජීත් සහ නියෝජ්‍ය ප්‍ර:අ: මහාචාර්ය ජේ.ජී.එස්. රණසිංහ, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

මෙහි මුඛ්‍ය පරමාර්ථය වනුයේ, දැනට සොයාගෙන නොමැති නිදන්ගත වකුගඩු රෝගයේ විවිධ ලක්ෂණ පිළිබඳ සොයාගැනීමයි. රෝගයේ ක්‍රමික වර්ධනය සහ මරණයට පත්වීම සඳහා බලපාන සාධක හඳුනාගැනීම සඳහා නිදන්ගත වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගීන්ගෙන් ලබාගත් රුධිර සහ මූත්‍ර සාම්පල විශ්ලේෂණය කරනු ලැබේ. රෝගය ව්‍යාප්තව පවතින ප්‍රදේශයන් වන ගිරාඳුරුකෝට්ටේ සහ විල්ගමුව යන ප්‍රදේශයන්හි අංගසම්පූර්ණ භූ පරිසර අධ්‍යයනයක් සිදුකරනු ලැබූ අතර ICPMS යන්ත්‍රය භාවිතයෙන් එම ප්‍රදේශ වල ළිං, වැව් සහ කුඹුරු ආදියෙන් ලබාගත් ජල සාම්පල බැර ලෝහ සඳහා විශ්ලේෂණය කරන ලදී. GIS අනුරූපනය භාවිතයෙන් මහවැලි ප්‍රදේශයන්හී පරිසර දූෂණය පිළිබඳ ඉතිහාසය සොයා බැලීම, මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

ශ්‍රී ලංකාව තුළ විවිධ දේශගුණ තත්ත්වයන්ට ගැළපෙන භෝග ප්‍රභේද සහ වගාකිරීමේ ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීම හරහා ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම



(ප්‍ර:අ: ආචාර්ය ඩබ්.එම්.ඩබ්. වීරකෝන් සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය ඩී.එම්.ජේ.බී. සේනානායක, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, මහඉලුප්පල්ලම)

අධික උෂ්ණත්වයන්, ජල හිඟයට ඔරොත්තු දෙන, වැඩි ඵලදාවක් සහිත පළිබෝධ සහ රෝග සඳහා ඔරොත්තු දෙන/ප්‍රතිරෝධී මිරිස්, බඩඉරිඟු, මුං බීජ සහ සහල් ප්‍රභේද වැඩිදියුණු කිරීම, විවිධ දේශගුණ තත්ත්වයන්ට යෝග්‍ය කෘෂිකාර්මික භාවිතයන් යෝජනා කිරීම; පාංශු තෙතමන දර්ශක භාවිතයෙන් නියඟයන්ට වඩාත් ලක්විය හැකි ප්‍රදේශ හඳුනාගැනීම සහ සිතියම්ගත කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණුවේ.

ප්‍රමාණවත් ඵලදාවක් පවත්වා ගනිමින් සහ පාංශු සාරවත්භාවය වර්ධනය කරගනිමින් අකාබනික පොහොර භාවිතය අවම කරනු පිණිස පරිසර හිතකාමී වගා තාක්ෂණයන් වැඩිදියුණු කිරීම.




(ප්‍ර:අ: ආචාර්ය සමන් ධර්මකීර්ති, ආචාර්ය ඩබ්.එස්. දන්දෙනිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ, ශ්‍රී ලංකාවේ වී වගාවේදී රසායනික පොහොර භාවිතයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ ඒ හරහා රටෙහි රසායනික පොහොර භාවිතය අවම කරනු පිණිස පරිසර හිතකාමී සහ ගොවිජන හිතකාමී තාක්ෂණයන් වැඩිදියුණු කිරීමය. එමෙන්ම, ශාකවල මනා පැවැත්ම වැඩිදියුණු කිරීම හා වී වගා බිමෙහි වෙනත් කෘෂි රසායනයන්හි භාවිතය අවම කිරීම සඳහා මෙම තාක්ෂණයන්හි ඵලදායී යෙදවීම පිළිබඳ සොයාබැලීමද මෙමගින් අපේක්ෂිතය. පෞද්ගලික අංශයේ ආයෝජකයින් සමඟ ඇති කරගනු ලැබෙන සහයෝගීතාවයන් හරහා මෙම වැඩිදියුණු කරන ලද තාක්ෂණයන් ගොවීන් වෙත හඳුන්වා දෙනු ඇත.

භූගත ජලයේ දියවී ඇති සමස්ත ඝන ද්‍රව්‍ය සහ ෆ්ලුවොරයිඩ් සඳහා ප්‍රතිකර්ම යෙදීමේ පහසුකමක ආකෘතියක් වැඩිදියුණු කිරීම - වියළි කලාපීය පානීය ජල ගැටලු සඳහා තිරසර විසඳුමක්




(ප්‍ර:අ: මහාචාර්ය රොහන් වීරසූරිය, ආචාර්ය එස්.කේ. වේරගොඩ, ජාතික මූලික අධ්‍යයන ආයතනය)

වියළි කලාපයේ ජලයේ තත්ත්වය සම්බන්ධයෙන් පැන නැඟ ඇති ගැටලු සඳහා තිරසර විසඳුමක් ලබාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මේ යටතේ විද්‍යුත් ආතංචනය (electro-coagulation) සහ නිනිති පටල පෙරීමේ ක්‍රමය (nano membrane filtration) යොදා ගනිමින් ජලයේ අඩංගු අතිරික්ත ෆ්ලුවොරයිඩ සහ සමස්ත දියවූ ඝන ද්‍රව්‍ය නියාමනය කිරීම සඳහා යෝග්‍ය තාක්ෂණය සහිත ජංගම ප්‍රතිකර්ම පහසුකමක් තැනීමට යෝජිතය. මෙම යෝජිත ජල ප්‍රතිකර්ම ආකෘතිය ආරම්භයේදී කුඩා ගම්මානයක් සඳහා සීමාවනු ඇත. ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ පාලනය යටතේ, ජල ප්‍රභවය ආසන්නයේ පදිංචි ග්‍රාමීය පාරිභෝගිකයන් වෙත ඔවුන්ගේ එදිනෙදා පරිභෝජනය සඳහා මෙම පිරිසිදු ජලය බෙදාහැරීම සිදුකෙරෙනු ඇත. ජල හිඟයෙන් පීඩා විඳින ප්‍රජාවන්ගේ ගැටලු සඳහා කඩිනම් විසඳුමක් ලබාදීමේ අත්‍යාවශ්‍ය පළමු පියවරක් මේ හරහා තැබෙනු ඇත.

ජල පවිත්‍රකරණය සඳහා උසස් ද්‍රව්‍ය මත පදනම්වූ පෙරහන් වැඩිදියුණු කිරීම




(ප්‍ර:අ: ආචාර්ය රෝහිණී ද සිල්වා, ආචාර්ය නලින් ද සිල්වා, කොළඹ විශ්වවිද්‍යාලය)

ජල පවිත්‍රීකරණ ක්‍රියාවලිය සඳහා ග්‍රාමීය ප්‍රජාව වෙත විදුලිය අවශ්‍ය නොවන, අඩු වියදම් සහ ඵලදායී ජල පෙරහනක්, සපයාදීම මෙහි මූලික අරමුණවේ. මෙම තිරසර ජල පවිත්‍රීකරණ පද්ධතිය දේශීය නිෂ්පාදකයෙකු විසින් නිෂ්පාදනය කෙරෙනු ඇත. මෙහි නිර්මාණය කර ඇති බහුවිධ පද්ධතීන් මගින් බැක්ටීරියා, කාබනික දූෂක ද්‍රව්‍ය, බොර පැහැය, බැරලෝහ සහ අනෙකුත් අකාබනික දූෂක ද්‍රව්‍ය ඉවත් කෙරෙනු ඇත.

දූෂණය පාලනය කිරීම හා අගය එකතුකිරීම සඳහා මධ්‍යම හා කුඩා පරිමාණ විවෘත කසල ගොඩවල් සඳහා විස්තීර්ණ විසඳුමක්



(ප්‍ර.අ: ආචාර්ය මෙත්තිකා විතානගේ, ආචාර්ය බී.සී. එල්. අතපත්තු, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

නාගරික කාබනික සහ අපද්‍රව්‍ය කාබනීතෘත ද්‍රව්‍ය බවට පරිවර්තනය කිරීම සඳහා - මධ්‍යම හා කුඩා පරිමාණ විවෘත කසල ගොඩවල් කළමනාකරණය සඳහා තිරසාර විස්තීර්ණ විසඳුමකි.

අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන

ජාතික පර්යේෂණ සභාවේ අන්වේෂක මත පදනම්වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන සඳහා ලැබී තිබූ අයදුම්පත් සමගින් 2019 වසර ආරම්භ විය. සියළුම විශ්වවිද්‍යාල, පීඨයන් සහ සියළුම රජයේ පර්යේෂණ හා සංවර්ධන ආයතන අතර සංසරණය කරන ලද පුවත්පත් දැන්වීමක් හරහා පර්යේෂණ සභාවේ අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන සඳහා අයැදුම්පත් කැඳවනු ලැබීය.

අයැදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2018 නොවැම්බර් 05 වූ අතර අයැදුම්පත් 102ක් ලැබී තිබුණි. පළමු කාර්තුව තුළදී දැනට ක්‍රියාත්මක ප්‍රදානයන්ගේ වාර්ෂික ප්‍රගති වාර්තාවන් ඇගැයීම් සඳහා යවන ලදී.

මෙම ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුමකින් යුත් ඇගැයීම්කරුවන් වෙත මෙම අයැදුම්පත් (2019) යවනු ලැබිණි. කවුන්සිලය මගින් සාකච්ඡා මණ්ඩල හරහා තවදුරටත් අයැදුම්පත් පරීක්ෂාවට ලක්කොට ඉහළ මට්ටමේ විද්‍යාත්මක කුසලතාවයක් සහ ජාතික අදාලත්වයක් පෙන්නුම් කෙරෙන අයැදුම්පත් ප්‍රදානය සඳහා තෝරාගනු ලැබිණි.

ක්‍රියාකාරකම	*2017*	*2018*	*2019*
ඇගයීමෙන් පසු මූල්‍යනය සඳහා තෝරාගත් අයැදුම්පත් සංඛ්‍යාව	*33*	*24 + 4*	*37*
මූල්‍යනය කරනු ලැබූ ප්‍රදාන සංඛ්‍යාව	*32*	*24 + 4*	*28*
භාණ්ඩාගාර ප්‍රතිපාදන හරහා පිරිනමනු ලැබූ ප්‍රදානයන්හී මුළු වටිනාකම	රු. මිලි. *128.7*	රු. මිලි. *120.93*	රු. මිලි. *128.4*

ඉදිරිපත් කරනු ලැබූ අයැදුම්පත් අතරින් 36%ක් (37/102) පමණක් තෝරාගනු ලැබූ අතර තෝරාගනු ලැබූ අයැදුම්පත් මූල්‍යනය සඳහා මහාභාණ්ඩාගාරය වෙත යොමු කරන ලදී. තෝරාගත් අයදුම්පත් අතරින් අයදුම්පත් දෙකක් ප්‍රධාන අන්වේෂක විසින් ඉල්ලා අස්කර ගනු ලැබූ අතර ප්‍රධාන අන්වේෂකයින් විසින් අදාල ව්‍යාපෘති වලින් ඔවුන්ව ඉවත්කරන ලෙස ඉල්ලා සිටි බැවින් කවුන්සිලය මගින් අයදුම්පත් දෙකක් සුදුසුකම් නොලැබීය. 2019 වසර අවසානය වනවිට අයදුම්පත් පහක් කවුන්සිලයේ තීරණය අපේක්ෂාවෙන් පසුවිය.

මෙම වර්ෂය තුළදී, 2019 වර්ෂයේදී ඉදිරිපත් කරනු ලැබූ අයැදුම්පත් ඇසුරෙන් පර්යේෂණ ප්‍රදාන 28ක් මූල්‍යයනය කරනු ලැබූ අතර එම ප්‍රදානයන්හී කටයුතු ආරම්භ කෙරිණි.

වර්ෂය අවසානයේදී, ප්‍රදානයන් 38ක් සඳහා ඇගැයීම් සම්පූර්ණ කරනු ලැබ තිබිණි.

2019 දී මූල්‍යයනය කළ පර්යේෂණ ප්‍රදාන

App. No.	ප්‍රධාන අන්වේෂක හා ආයතනය	මාතෘකාව
19-005	ආචාර්ය එස්. බාලකුමාර් යාපනය විශ්ව විද්‍යාලය	Supplement effect of Cherukurinja (*Gymnema lactiferum*) onglycemic control and on selected biochemical and physiological parameters among patients with type ii diabetes mellitus
19-006	මහාචාර්ය කේ.ඩී.ආර්.ආර්. සිල්වා ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය	Examination of the state of food literacy education and food environment in Sri Lankan secondary schools
19-019	ආචාර්ය ශිරෝමි කරුණාරත්න ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය	Development of a model to simulate the sustainability of infrastructure using life cycle approach
19-028	මහාචාර්ය බී.ජී.ඩී.එන්.කේ. ද සිල්වා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	Identification and characterization of etiological agents of brugian filariasis in Sri Lanka and their vectors
19-030	ආචාර්ය ඒ.එස්. හේවගේ ජෛව රසායන විද්‍යා, අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණ ආයතනය	Genetic analysis for predictive markers for hepatocellular carcinoma (HCC) in non-alcoholic steatohepatitis (NASH) related cirrhosis
19-032	ආචාර්ය එම්.ඒ.විජේවර්ධන මොරටුව විශ්ව විද්‍යාලය	Development of new Thermo-Electric (TE) materials for automobile heat recovery applications
19-033	ආචාර්ය කේ. ඩී. පී. පී. ගුණතිලක ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය	Evaluation of potential health enhancing properties of edible flowers available in Sri Lanka
19-040	ආචාර්ය එස්. ජේ.සූරියආරච්චි මොරටුව විශ්ව විද්‍යාලය	Development of a network of subsoil sensors and drones for crop surveillance
19-045	ආචාර්ය ඩී. එන්. සුබ්‍රමනියම් යාපනය විශ්ව විද්‍යාලය	Characterization of porosity distribution in porous concrete with compaction energy
19-046	මහාචාර්ය සමන් සෙනවීර ජාතික මූලික අධ්‍යයන ආයතනය	Efficacy and welfare of Aversive Geofencing Devices for managing the movements of Asian elephants
19-050	ආචාර්ය පී. එස්. පෙරේරා කැලණිය විශ්ව විද්‍යාලය	Comprehensive biochemical and molecular analysis of patients suspected with inherited hemolytic anemia in Sri Lanka and

		assessment of its contribution to anemia burden in the community
19-051	ආචාර්ය. එල්. බී. ඩී. ආර්. පී. විජේසුන්දර කැලණිය විශ්ව විද්‍යාලය	Development of an environmentally friendly high efficient low cost Cu_2O homojunction solar cell
19-052	ආචාර්ය. ආර්. පී. හෙට්ටිආරච්චි රබර් පර්යේෂණ ආයතනය	Enhancing soil fertility in degraded rubber lands by combine use of agro management practices such as inorganic fertilizer, biofertilizer, cover cropping and mulching with organics
19-054	ආචාර්ය. ප්‍රසාද් සේනාධීර ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය	Investigation of cultivar dependent dynamics of seed metal ion content and identification of prospective genetic candidates for nutritional quality improvement in Sri Lankan rice germplasm
19-058	ආචාර්ය. වයි. ඩී. සිරිවර්ධන කොළඹ විශ්ව විද්‍යාලය	A needs assessment study of young and mid-career academics in Sri Lankan Universities aiming at evidence-based decision making
19-061	ආචාර්ය. ආර්. ඒ. එස්. ඩබ්. රණසිංහ ජාතික ශාක උද්‍යානාගාරය	DNA Bar-coding, Morphological Taxonomy and Phylogeny of Syzygium spp. of Family Myrtaceae in Sri Lanka: Implications for Conservation and Sustainable Exploitation
19-062	මහාචාර්ය. ටී. ඩී. සිල්වා කොළඹ විශ්ව විද්‍යාලය	Genetic diversity and relationship among agronomically locally adapted black pepper (*Piper nigrum*) accessions from selected localities in Sri Lanka and their endophytes, applied to biotic stress tolerance and growth promotion
19-065	වෛද්‍ය භාසිත තිසේරා වසන්ගතරෝග විද්‍යා අංශය සෞඛ්‍ය අමාත්‍යාංශය	Development of a colorimetric reverse transcription Loop-mediated isothermal amplification (RT-LAMP) assay as a cost-effective, novel surveillance tool for differential detection of dengue serotypes in Aedes mosquitoes
19-072	මහාචාර්ය. එච්. එම්. එස්. කේ. හේරත්, ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය	Determination of the variation of soil carbon dynamics and soil physico-chemical properties in tropical rainforests and tropical montane forests in Sri Lanka across an altitudinal gradient
19-075	ආචාර්ය. ඒ. වෙන්ගාදරමන යාපනය විශ්ව විද්‍යාලය	Bioethanol production from marine algae
19-076	ආචාර්ය. ඩබ්. ඩී. ඩී. ප්‍රනාන්දු පේරාදෙණිය විශ්ව විද්‍යාලය	Development of irradiated multivalent chicken coccidial oocyst vaccine in Sri Lanka in order to minimize drug residues in poultry products
19-080	ආචාර්ය. බී. කේ. ආර්. පී. රොද්‍රිගු මොරටුව විශ්ව විද්‍යාලය	Computational Optimization of Deep Neural Networks in a Digital Signal Filtering Perspective
19-081	ආචාර්ය. නයනා විජයතිලක ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	Analyzing the phylogenetic relationships of Sri Lankan Agamid Lizards to facilitate their conservation

19-089	ආචාර්ය. ඩී. ආර්. ඒ. දිසානායක පේරාදෙණිය විශ්ව විද්‍යාලය	Analysis of multidrug resistant Extra intestinal Pathogenic Escherichia coli clones in humans and animals in Sri Lanka and determine the potential of developing a vaccine to eliminate the clones
19-090	ආචාර්ය. අයි. පී. එල්. ජයරත්න ජාතික මූලික අධ්‍යයන ආයතනය	Synthesis of modified Zeolite for catalytic converting and removal of NO_x, SO_x and CO from the vehicle exhaust
19-092	ආචාර්ය. පී. එල්. ධර්මප්‍රිය පේරාදෙණිය විශ්ව විද්‍යාලය	Petrogenesis, geochemistry and potential of economic mineralization of granitic pegmatite in Sri Lanka
19-095	ආචාර්ය. ඩබ්. එල්. අයි. විජේසේකර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	Characterization of proteins from underutilized Sri Lankan seaweeds and application as protein alternatives in bakery foods
19-099	මහාචාර්ය. අජිත් ද එස්. නාගහවත්ත රුහුණු විශ්ව විද්‍යාලය	A “One Health” approach: the epidemiology of methicillin-resistant *Staphylococcus aureus* isolated from humans, animals and animal products in southern Sri Lanka





විද්‍යාත්මක පර්යේෂණ සඳහා වන ජනාධිපති සම්මාන

විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානෝත්සවය, දොළොස්වන වරට ද 2019 අගෝස්තු 26 දින කොළඹ, ටාජ් සමුද්‍ර හෝටලයේදී පවත්වන ලදී.

ශ්‍රී ලංකීය ආයතන වලට අනුබද්ධ ශ්‍රී ලංකීය විද්‍යාඥයින් 20%ක් හෝ ඊට වැඩිදෙනෙකු විසින් ලිපි පල කරනු ලබන SCImago සඟරා ශ්‍රේණිගත කිරීම අනුව ඉහලම ස්ථානයේ ශ්‍රේණිගත කරන ලද සඟරාවන්හි වෛද්‍ය විද්‍යාව, කෘෂිකර්මය සහ ඉංජිනේරු විද්‍යාව ඇතුළත් විෂයයන් පිළිබඳ පළකරන ලද ප්‍රමුඛ පත්‍රිකා 100ක් සඳහා සම්මාන පිරිනැමින.

මෙම අවස්ථාව සඳහා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍ය සුජීව සේනසිංහ මැතිතුමා සහ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම් චින්තක ලොකුහෙට්ටි මැතිතුමන් ද ආරාධිත අමුත්තන් ලෙස එම අවස්ථාවට සහභාගිවූ අතර පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හී, විශ්වවිද්‍යාලයන්හී සම්භාවනීය ආරාධිතයින්ද, සම්මාන ලැබූවන්ද සහභාගී වූහ.

ජාතික පර්යේෂණ සභාව විසින් ජනාධිපති ලේකම් කාර්යාලයේ සහ රේඛීය අමාත්‍යාංශවල සහයෝගීතාවට ඇතිව මෙම උළෙල සංවිධානය කරන ලදී. 2019 වසර ජාතික පර්යේෂණ සභාවේ විසිවන සංවත්සරය වූ බැවින් සම්මාන උළෙලේ පළමු භාගයේදී NRCහි එක් ප්‍රමුඛ වැඩසටහනක් වන ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදානයන්හි සාර්ථකත්වය පෙන්නුම් කරමින් පර්යේෂණ ප්‍රදානලාභීන් පස්දෙනෙකු විසින් අමතර ඉදිරිපත් කිරීම් කරනු ලැබීය.














Environmental Pollution









රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා වැඩසටහන

මෙම කාලසීමාව තුලදී රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා (PPP) වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි..

ක්‍රියාකාරකම්	2017	2018	2019
PPP සඳහා ලද අභිමතයන් පළකිරීම් (EOI) සංඛ්‍යාව	10	15	7
විස්තරාත්මක යෝජනා ඉදිරිපත් කිරීම සඳහා තෝරාගත් EOI සංඛ්‍යාව	4	7	5
පෞද්ගලික අංශය සමග ඇතිකර ගත් සහයෝගිතාවන් සංඛ්‍යාව	2	3	1
අවශ්‍ය මුළු අරමුදල්	රු.මිලි. 6.84	රු.මිලි. 20.26	රු.මිලි. 42.23
පෞද්ගලික අංශය මඟින් සපයනු ලැබූ මුදල (දළ වශයෙන්. 50%)	රු.මිලි. 3.42	රු.මිලි. 10.13	රු.මිලි. 21.90

දැනට ක්‍රියාත්මක රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාවන් .....

පර්යේෂණ සහකරු	ව්‍යාපෘති නාමය
ආචාර්ය ශාන්ත වල්පලගේ මොරටුව විශ්ව විද්‍යාලය	Development of a material using natural rubber and polyethylene as a substitute to conventional roofing sheets
ජී. එල්. සී. ගලහිටියාව මහතා / එම්. ඒ. වම්න්ද්‍ර මහතා තේ පර්යේෂණ ආයතනය	Development of Self-Cleaning Sifter with multiple mesh frames for grading long leafy & wiry type tea
ආර්.එම්. ධර්මදාස මහතා කාර්මික තාක්ෂණ ආයතනය	Extraction and formulation of plant protection products from endemic plants for healthy growth of crops free from sucking insects (mealy bugs, aphids, whiteflies and thrips) causing yellowing, wilting and leaf-curl
ආචාර්ය එන්.එම්.එස්. සිරිමුතු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	Nanomaterials for improved electrical conductivity of natural rubber compound for non-marking solid tires
මහාචාර්ය එන්.කේ.බී. අදිකාරම් ජාතික මූලික අධ්‍යයන ආයතනය	Study of a postharvest disease and disorders adversely affecting the export potential of mango var. TomEJC and their management
ආචාර්ය මාලක ජේ. වල්පොල / ආචාර්ය කුටිල ගුණසේකර මොරටුව විශ්ව විද්‍යාලය	Cross platform for annotations in mobile tablets
ආචාර්ය ජේ. සී. පී. එච්. ගමගේ මොරටුව විශ්ව විද්‍යාලය	Development of an economical insulation system for externally strengthened FRP / Concrete composites using locally available materials
මහාචාර්ය එස්. ආර්. මුණසිංහ මොරටුව විශ්ව විද්‍යාලය	Development of commercial prototypes of multipurpose drones – CeyGull and CeyBell
ආචාර්ය ගෝබිතාස් තාමරාජා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය.	A composition and method of seepage control using fibrous material
මහාචාර්ය නිල්වලා කෝට්ටෙගොඩ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	Development of waste coconut coir based multi-purpose nano-water filters

1. පොලිතින් තිරසාර කළමනාකරණය පිළිබඳ සුහසාධක වැඩසටහන

ජාතික පර්යේෂණ සභාව විසින් ජනාධිපති ලේකම් කාර්යාලය, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය හා මධ්‍යම පරිසර අධිකාරිය සමගින් පොලිතින් තිරසාර කළමනාකරණය පිළිබඳ සුහසාධක වැඩසටහනක් දියත් කරනු ලැබීය. මෙය NRCහි ආයතනික සමාජ වගකීම් (CSR) වැඩසටහනෙහි ආරම්භය වනු ඇති බව ද අපේක්ෂා කෙරිණ.

උතුරු මැද පළාතේ පාසල් ළමුන් අතර පොලිතින් භාවිතය අවම කිරීමේ අදහස ඇතිකිරීම සඳහා වන දැනුම්වත් කිරීමේ වැඩසටහනකි. මෙම වැඩසටහන මගින් මූලිකවම උතුරු මැද පළාතේ (NCP) පාසල් ළමුන් අරමුණු කෙරිණ. සාපේක්ෂව කුඩා ජන ඝනත්වයක් පැවතියද උතුරු මැද පළාතේ ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය වසරක් පාසා වැඩිවන බැවින්, රටේ පොලිතින් ප්‍රශ්නයට විසඳුමක් සෙවීම සඳහා එය ආදර්ශ වැඩසටහනක් ලෙස යොදාගැනීම සඳහා NRC විසින් උතුරු මැද පළාතේ සභාවේ නිලධාරීන් සමග මූලික සාකච්ඡා සිදුකරනු ලැබීය. මෙම සාකච්ඡාවේදී නිලධාරීන්ගෙන් 95% පමණ (සහභාගිවූ නිලධාරීන් 120 අතරින්) පාරිසරික හිතකාමීත්වය කෙරෙහි පාසල් සිසුන්ගේ ආකල්පය ගොඩනැගීම/වැඩිදියුණු කිරීම සිදුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබීය.

එමනිසා NRC විසින් පාරිසරික, සෞඛ්‍යය, ඝන ද්‍රව්‍ය කළමනාකරණය හා රසායන ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යාව වැනි අදාල ක්ෂේත්‍රයන්හි විද්‍යාඥයින් කීපදෙනෙකු සමග අධ්‍යාපනික වැඩසටහනක් ගොඩනගනු ලැබීය.
වැඩසටහන පියවර තුනකින් යුක්තවිය;

1. මූලික සාකච්ඡාව - 2017
2. පුහුණුකරුවන් පුහුණු කිරීම - 2017
3. ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන - 2018
4. ප්‍රගතිය ඇගයීම සඳහා දත්ත රැස්කිරීම - 2019
5. අධීක්ෂණය හා ඇගයීම - 2019

ප්‍රගතිය ඇගයීම සඳහා දත්ත රැස්කිරීම

ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනට පසුව NRC විසින් ප්‍රශ්නාවලියක් යවා මාස තුනකදී සම්පූර්ණ කරන ලද එම ප්‍රශ්නාවලිය එකතුකර ගැනීම මගින් උතුරු මැද පළාතේ පාසල් 810 ක් අධීක්ෂණය කරනු ලැබීය.

අධීක්ෂණය හා ඇගයීම

ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහනට පසුව NRC විසින් ඉහත වැඩසටහන ඇගයීම සඳහා අධීක්ෂණය කිරීමේ හා ඇගයීමේ වැඩසටහනක් පවත්වනු ලැබීය.

මෙහි පළමු පියවර ලෙස NRC විසින් ඇගයීමේ වැඩසටහන පැවැත්වීම සඳහා කමිටුවක් පත්කරන ලෙස ජාතික විද්‍යා ඇකඩමියෙන් ඉල්ලා සිටිනු ලැබූ අතර ඔවුන් විසින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇත. ඒ අනුව NRC විසින් ඉහත කමිටුව සමඟ සාකච්ඡාකර අධීක්ෂණය කිරීමේ හා ඇගයීමේ වැඩසටහනක් සකස්කර ඇත.

ඉහත වැඩසටහනට අනුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ මගපෙන්වීම ඇතිව කමිටුව විසින් ප්‍රශ්නාවලියක් සකස්කර ඇති අතර පරිසර විද්‍යා අධ්‍යයන අංශයේ 3වන හා 4වන වසර සිසුන් සමග එක් එක් පාසල වෙත සංචාරය කිරීමට ඔවුන් තීරණය කරනු ලැබීය.

ඉහත කමිටු සාමාජිකයින්, ශිෂ්‍යයින් හා NRC කාර්ය මණ්ඩලය උතුරු මැද පළාතේ අධ්‍යාපන කලාප තුනක (කැකිරාව, හිගුරක්ගොඩ හා පොලොන්නරුව) පාසල් සඳහා සංචාරය කරනු ලැබිය. මෙම සංචාර තුනට පසුව කමිටුව විසින් NRC වෙත වාර්තාවක් ලබාදෙනු ලැබූ අතර ඔවුන් විසින් පොලිතීන් තිරසර කළමනාකරණ වැඩසටහන 75%ක සාර්ථකත්වයක් පෙන්නුම්කරන බව ප්‍රකාශකරනු ලැබූ අතර මෙම වැඩසටහන වැඩිදියුණු කිරීම සඳහා යෝජනා කීපයක් ද ඉදිරිපත් කරනු ලැබීය.







2. සුභසාධක වැඩසටහන - ප්‍රදර්ශන

ශිල්පසේනා I තාක්ෂණ විප්ලවය - කොළඹ

2019 ජූලි 18 සිට 21 දින දක්වා කොළඹ BMICH හිදී ප්‍රදර්ශනය පැවැත්විණ. NRC විසින් ප්‍රදර්ශනයේ තාක්ෂණ කලාප 12න් එකක් වන ස්නායු තාක්ෂණ කලාපය සම්බන්ධීකරණය කරනු ලැබීය. 200,000කට වැඩි පිරිසක් ස්නායු තාක්ෂණ කලාපය නැරඹීමට පැමිණි අතර එය ප්‍රදර්ශනයේ ජනප්‍රිය තාක්ෂණ කලාපයක් බවට පත්විය.





ශිල්පසේනා II තාක්ෂණ විප්ලවය - පොලොන්නරුව

